කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

# සිංහල භාෂාව හා සාහිත්‍යය

7 ශ්‍රේණිය

කාලය පැය $1^{1/2}$ යි

## 1 - කොටස

- පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

01. සිංහල අක්ෂර මාලාවේ ප්‍රධාන කොටස් 2 ක ලියන්න.

 i. ............................................

 ii. ............................................

02. අක්ෂර මාලාවේ ඇති දැනට භාවිත නොවන අක්ෂර මොනවාද ?

03. පහත දැක්වෙන වචනවල පිල්ලම් නම් කරන්න.

 i. ආදරය -

 ii. රුවල -

04. පහත සඳහන් වචන අතරින් නිවැරදි වචන තෝරා ලියන්න.

 නිශ්පල , මර්ධනය, කනිෂ්ඨ, වාර්ථාව, ප්‍රතිඵල

 ..........................................................................................................

05. පහත දැක්වෙන ඉඟිවැකිවල අදහස ලියන්න.

 i. ලෑල්ලට පාගලා ගියා -

 ii. ඉහේ මලක් පිපුණා -

06. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළුවල හිස්තැන් පුරවන්න.

 i. ........................................ පලා මල්ල වගේ.

 ii. කටින් .................................... සිටවනවා වගේ.

07. පහත දැක්වෙන අදහස්වලට තනිපද ලියන්න.

 i. ගොයම් කැපූ පසු කුඹුරේ ඉතිරිවන කොටස ..................................................

 ii. උපසම්පදා නොවූ භික්ෂුව ....................................................

08. 'අඳුර' යන පදයට සමාන පදයක් හා විරුද්ධ පදය ලියන්න.

 ............................................ ............................................

09. පහත දැක්වෙන යුගල පද සම්පූර්න කරන්න.

 i. සද්ද ........................................

 ii. ගෙවල් ........................................

10. කමත් බසෙහි යෙදෙන වචනවල සාමාන්‍ය ව්‍යවහාරය ලියන්න.

i. කිරිකබඩ - ....................................

ii. කළු ගගුල - ....................................

11. ල ළ මුලට යෙදුණ වචන 2 ක් ලියන්න.

..................................

..................................

12. න , ණ මුලට යෙදුණ වචන 2 ක් ලියන්න.

..................................

..................................

13. පහත දැක්වෙන පදවල අනුක්ත පද ලියන්න.

i. මම - ....................................

ii. ඔවුහු - ....................................

14. පහත දැක්වෙන වචනවල බහුවචන ලියන්න.

i. ලෑල්ල - ....................................

ii. රට - ....................................

15. පහත දැක්වෙන වචනවල ස්ත්‍රීලිංග පද ලියන්න.

i. මොනරා - ....................................

ii. ගුරුවරයා - ..............................

16. පහත දැක්වෙන වාක්‍යයේ කළු කර ඇති වචනවල තේරුම ලියන්න.

ඔහු වනයට යද්දී කකුලේ **වණයක්** ඇතිවිය.

17. පහත දැක්වෙන වාක්‍යයට සුදුසු විරාම ලකුණු යොදන්න.

අම්මේ පත්තරය බලනවා ද

18. පහත දැක්වෙන වාක්‍යවලට ගැළපෙන උක්ත පද ලියන්න.

i. .................................... පාඩම් කළෙහු.

ii. .................................... පන්සලට ගියාය

19. පහත දැක්වෙන වාක්‍යවලට ගැළපෙන අඛ්‍යාත පද ලියන්න.

i. අපි ගිය සතියේ නුවර ................................................

ii. හොඳ ළමයි පේළියට ගමන් ........................................

20. පහත දැක්වෙන වාක්‍ය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

i. වචනයක 'න' යන්නට පළමු ව යෙදෙන්නේ 'ෂ' ය. (   )

ii. 'නුඹ' යන පදය මධ්‍යම පුරුෂ ඒකවචනයකි. (   )

01) පහත දැක්වෙන පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. හොඳයි, මම මින් ගැලවෙන විදියක් කියන්නම්. හැබැයි මා කියන හැටියට කරන්න ඕනෑ .........

අ) ~~මෙසේ කීවේ කවුද ?~~

ආ) මෙසේ ක්වේ කාටද ?

ii. ''ආයුබෝවන්, ස්වාමිනි, ඔබ වහන්සේට පින් අත්වේවා !

අ) මෙය ඇතුළත් පාඩම කුමක්ද ?

ආ) මෙසේ කීවේ කවුද ?

iii. 'ආ.......... මට ඒක කියලා දෙන්න බැරිවුණා. මේ ගොන් කණුව ළඟ ම ඉන්නේ මුදුන''

අ) මෙසේ කියන්නේ කවුද ?

ආ) මෙසේ කියන්නේ කවුරුන් ගැන ඇසූ නිසාද ?

iv. 'හා .......... හා .......... යමු දරුවනේ, සේදැරි කරමු. සේදරු කරමු'

අ) සේදැරි කරමු' යන්නෙහි අදහස ලියන්න.

ආ) මේ පාඨය සඳහන් පාඩම කුමක්ද ?

v. හින්දු ආගම ඔවුන් සාමාන්‍යයෙන් අදහන ආගම වුව ද බෞද්ධාගමික විශ්වාසය මත පදනම්ව පෝය දිනවල සතුන් මැරීමෙන් වැළකී සිටිනු දැකිය හැකි ය.

අ) මේ විස්තරය ඇති පාඩම කුමක්ද ?

ආ) මෙහි සඳහන් වන්නේ කවුරුන් පිළිබඳව ද ?

02) පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

උදෑසනම පොඩි අපි දුව යනවා - කොහේද සැගවී එළියට එයනවා
උදේ පාන්දර පාසල් යන්නට - බසයක් ඇවිදින් කතා කරනවා
මේ පොඩි බස්රිය ඔබේය හිතලා - කුරුටු ගෑම හොඳ නෑ ඉරි ඇඳලා
අසුන් කඩා බිඳ දමා නොයන්නේ - ඔබේ ය මේ බස්රිය රැකගන්නේ

i. මෙහි සඳහන් ළමයින් යන්නේ කොහේද ?
ii. ඔවුන් එහි යන්නේ කුමකින් ද ?
iii. එහි දී නො කළ යුතු දේවල් 2 ක් ලියන්න.
iv. මෙම කවියේ සඳහන් සර්ව නාම පද 2 ක් ලියන්න.
v. කවියේ සඳහන් සඤ්ඤක අක්ෂර යෙදුණු වචන 2 ක් ලියන්න.

03) ඔබ විද්‍යාලයේ පැවැති නිවාසාන්තර ක්‍රීඩා උත්සවය පිළිබඳ දක්වමින් ඔබේ මිතුරාට / මිතුරියට ලියන ලියුම ලියන්න.